www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බෝම්බ පිපිරීම ගම්වැසියන් 64ක් ඝාතනය කොට ශ්‍රී ලංකාව යුද්ධය දෙසට තල්ලු කරයි

## Bomb blast kills 64 villagers and catapults Sri Lanka towards war

**කේ. රත්නායක විසිනි**
**2006 ජූනි 17**

බ්‍රහස්පතින්දා උදේ පුපුරා ගිය බලගතු බෝම්බයකින්, ශ්‍රී ලංකාවේ උතුරු මැද පලාතේ කැබතිගොල්ලෑව නගරය බලා දිවෙන බස් රථයක ගමන් කරමින් සිටි මගීන් 64ක් ඝාතනය කොට අඩු ගනනේ 80කට තුවාල සිදු කෙරින. මෙම සාපරාධී ක්‍රියාව, 2002 සටන් විරාමයෙන් ඉතිරිව පවත්නා යමක් වේ ද එය විනාශ කරමින් දිවයින යලිත් සිවිල් යුද්ධය තුලට තල්ලු කිරීමේ එල්ලයෙන් යුක්තව හිතාමතාම සිදු කල ප්‍රකෝපකරනයකි. මෙම ප්‍රහාරය සිදු කලේ කවුරුන් වුවත්, වාර්ගික සතුරුකම් අවුලුවා එවන් ජන ඝාතනයක් සිදු විය හැකි දේශපාලන වාතාවරනය නිර්මානය කිරීම සම්බන්ධයෙන් කොලඹ ආන්ඩුව සහ එහි ස්වෝත්තමවාදී සගයන් සෘජුව ම වගකිව යුතු ය යන්න පිලිබඳ කිසිදු සැකයක් නැත.

ප්‍රහාරයට ගොදුරු වූවන්ගෙන් වැඩි දෙනා යාබද ගම්වල සිට නගරය කරා යමින් සිටි දුගී සිංහල ගොවීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ය. මිය ගිය අය අතර ලමුන් 15ක් විය. කොලඹ සිට කිලෝ මීටර් 240ක් පමන දුරින් පිහිටි මෙම ප්‍රදේශය, උතුරු පලාතේ යුද කලාපයන්ට මායිම්ව ඇත. උතුරු පාලතේ සැලකිය යුතු කොටසක් පවතින්නේ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පාලනය යටතේ ය.

ශ්‍රී ලංකා ආන්ඩුව බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් වහාම එල්ටීටීඊයට දොස් පවරා එල්ටීටීඊයේ පාලනය යටතේ පවත්නා භූමි ප්‍රදේශ මත ගුවන් ප්‍රහාර සහ කාලතුවක්කු වෙඩි ප්‍රහාර මාලාවක් එල්ල කිරීමට අන කරනු පිනිස කඩතුරාවක් ලෙස එම සිද්ධිය යොදා ගත්තේ ය. පලි ගැනීමේ ප්‍රහාර සීමිත නිවාරක පියවරක් යැයි මිලිටරිය කියාපෑවත් බෝම්බ පිපිරීමෙන් යන්තම් පැය තුනකට පසුව පටන් ගැනුනු ප්‍රහාර ඊයේ දක්වාත් පැවතුනි.

උතුරු පලාතේ දී, ගුවන් හමුදා ප්‍රහාරක යානා එල්ටීටීඊ දේශපාලන මූලස්ථානය පිහිටා ඇති කිලිනොච්චිය අවට ප්‍රදේශවලට ද එල්ටීටීඊයේ මූලික කඳවුරක් පිහිටා ඇති මුලතිව්වලට ද බෝම්බ දැමී ය. මුලතිව් අසල පිහිටා ඇති 2004 සුනාමි ව්‍යසනයෙන් විපතට පත් ජනයා වෙසෙන සරනගත කඳවුරක් පිහිටි සෙල්වපුරම් ඉලක්ක කර ගත්තේ යැයි එල්ටීටීඊය මිලිටරියට චෝදනා කලේ ය. නැගෙනහිර පලාතේ දී, හමුදාව මුතූර්හි එල්ටීටීඊ පාලනය යටතේ පවත්නා ප්‍රදේශයකට රොකට් වෙඩි ප්‍රහාරයක් එල්ල කලේ ය. තුවාල ලැබූ හා මිය ගිය අය පිලිබඳ සංඛ්‍යා ප්‍රකාශයට පත්ව නැතත් එල්ටීටීඊය කියා සිටියේ ගම්මාන ගනනාවක නිවාසවලට හානි සිදු වී ඇති බව යි.

පූර්න පරිමාන යුද්ධයක් ඉතා ම ආසන්න බව දෙපාර්ශ්වය ම පිලිගනී. එල්ටීටීඊ සාම ලේකම් කාර්යාලයේ ප්‍රධානි එස්. පුලිදේවන් සිකුරාදා මෙසේ අනතුරු ඇඟවී යː "ශ්‍රී ලංකා ආන්ඩුව ගුවන් ප්‍රහාර දියත් කිරීම මගින් පෙන්වන්නේ තමන් යුද්ධයට සූදානම් බව යැයි මම සිතමි. . . . අපගේ මධ්‍යම අන දෙන මන්ඩලය තත්වය තක්සේරු කරමින් සිටින අතර එය සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත." මිලිටරිය තමන්ගේ "නිවාරක" ප්‍රහාර නතර වන්නේ කවදාද යන වග ප්‍රකාශයට පත් කොට නැත.

කැබතිගොල්ලෑව ජන ඝාතනය සිදු කලේ කවුරුන් ද යන වග මේ අවස්ථාවේ තව මත් පැහැදිලි නැත. දෙපාර්ශ්වය ම එකිනෙකාට දොස් පවරා ඇත. සටන් විරාමය අධීක්ෂනය කරන ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) ඊයේ ප්‍රකාශ කලේ, "මෙම ම්ලේච්ඡ ක්‍රියාව පිටුපසින් සිටින්නේ කවුරුන් ද යන වගත් මනුෂ්‍ය වර්ගයාට එරෙහි එවන් තර්ජනයක් සඳහා ගාමකය විය හැක්කේ කුමක් ද යන වගත් නිර්නය කිරීමට" තමන් අපොහොසත් බව යි.

එල්ටීටීඊය බ්‍රහස්පතින්දා නිවේදනයක් නිකුත් කරමින්, කැබතිගොල්ලෑව බෝම්බ ප්‍රහාරය හෙලා දැක, එයට තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැති බව ප්‍රකාශ කොට, දෙමල සිවිල් වැසියන් ඝාතනය කිරීමෙහි ද යෙදී සිටින "සන්නද්ධ කොටස්වලට" එම ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා කලේ ය. "එල්ටීටීඊ නියෝජිත කන්ඩායම යුරෝපයේ සිට පැමිනි වහා ම සිදු කිරීමට සැලසුම් කර තිබූ කැබතිගොල්ලෑව ප්‍රහාරය එල්ටීටීඊය මත වරද පැටවීමේ තනි එල්ලය ඇතිව සිදු කල දුෂ්ට ඝාතන ක්‍රියාවක්" යැයි එම නිවේදනය ප්‍රකාශ කලේ ය.

කෙසේ වෙතත්, කැබතිගොල්ලෑව ප්‍රහාරය එල්ටීටීඊයේ ක්‍රියාවක් වීම විය හැක්කකි. සිවිල් වැසියන් ඉලක්ක කිරීම "මොනම හේතුවක් යටතේ වත් යුක්ති යුක්ත කල නොහැකි" බවට එල්ටීටීඊය කරන ප්‍රකාශය අතිශයින් ම කුහක ය. හිතාමතාම වාර්ගික භේදයන් ඇවිලවීමේ හා දෙමල ජනයා මත සිය ග්‍රහනය පවත්වා ගෙන යාමේ එල්ලයෙන් යුක්තව සිංහල හා මුස්ලිම් සිවිල් වැසියන් මත එල්ල කෙරුනු දුෂ්ට ප්‍රහාර මාලාවක් ම සම්බන්ධයෙන් එල්ටීටීඊය වගකිව යුතු ය.

එමෙන් ම, කැබතිගොල්ලෑව පිපිරීම, 2002 සටන් විරාමයට විවෘතව ම සතුරු, මිලිටරියේ, එය හා සම්බන්ධිත දෙමල පැරා-මිලිටරි කන්ඩායම්වල හෝ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය වැනි සිංහල ස්වෝත්තමවාදී පක්ෂවල කොටස් විසින් සිදු කරනු ලැබීම ද එලෙස ම විය හැක්කකි. මාස ගනනාවක් තිස්සේ, කරුනා කන්ඩායම වැනි සන්නද්ධ කන්ඩායම්, මිලිටරිය සමග හවුලේ කටයුතු කරමින්, එල්ටීටීඊය වෙතින් ප්‍රතිචාර අවුලුවා ගැනීමේ එල්ලයෙන් යුක්තව, එල්ටීටීඊ කේඩර, ආධාරකරුවන් හා දෙමල සිවිල් වැසියන් ඉලක්ක කර ගත් ඝාතන හා ප්‍රහාර මාලාවක් සිදු කර ඇත.

සටන් විරාමය අත්සන් කල අවස්ථාවේ පටන් ම, මිලිටරියේ කොටස් සහ සිංහල අන්තවාදී කන්ඩායම් සටන් විරාමයටත් සාම සාකච්ඡාවලටත් එරෙහිව උද්ඝෝෂනය කරමින් සිටිති. ප්‍රචන්ඩ ක්‍රියා මෑත දී උත්සන්න වීමෙහි ආරම්භය පසු ගිය වසරේ අගෝස්තු 12 දා ශ්‍රී ලංකාවේ විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය දක්වා අතීතයට දිවෙයි. එම ඝාතනය සම්බන්ධයෙන් ද එල්ටීටීඊයට දොස් පැවරූ අතර එය ද යුද්ධයට පක්ෂ හිස්ටීරියාවක් අවුලුවනු පිනිස ජවිපෙ, හෙල උරුමය හා මිලිටරිය විසින් ගසා කන ලදී. කැබතිගොල්ලෑව ප්‍රහාරයේ දී මෙන් ම, එල්ටීටීඊයට එරෙහිව කිසිදු නිශ්චිත සාක්ෂ්‍යයක් තවමත් ප්‍රකාශයට පත් කොට නැති අතර එයින් දේශපාලන වාසි නෙලා ගත් අය ම කදිරගාමර් ඝාතනය සංවිධානය කලා වීමට බෙහෙවින් ඉඩ ඇත.

කදිරගාමර් ඝාතනයෙන් අනතුරුව, නව ජනාධිපතිවරනයක් ඉක්මනින් ම කැඳවුනු අතර, ජවිපෙ හා හෙල උරුමයේ පිටුබලය සහිතව මහින්ද රාජපක්ෂ එහි දී යන්තමින් ජය ලැබී ය. ඔවුන්ගේ සහයෝගයට හිලව් වසයෙන්, ඒ වන විටත් හෙලත්තාඩු වී තිබූ සටන් විරාමයට වල කැපීම එල්ල කර ගත්, එම ගිවිසුම සංශෝධනය කිරීම හා සන්නද්ධ හමුදා ශක්තිමත් කිරීම ඇතුලත්, ආක්‍රමනශීලී ඉල්ලීම් මාලාවකට රාජපක්ෂ එකඟ විය. රාජපක්ෂ ජනාධිපති ලෙස පත් වීම, එල්ටීටීඊයට හා එහි ආධාරකරුවන්ට විරුද්ධව උතුරේ හා නැගෙනහිර දී රහසිගත ප්‍රහාර උත්සන්න කරනු පිනිස කොල එලිය පත්තු කිරීමක් ලෙස සලකනු ලැබුනි.

බ්‍රහස්පතින්දා ජනාධිපති රාජපක්ෂ කැබතිගොල්ලෑව රෝහලේ සිටින තුවාලකරුවන් බැලීමට ගිය අතර ඔහු එහි දී "කලබල නොවී සන්සුන්ව" සිටින ලෙස ආයාචනා කලේ ය. එල්ටීටීඊය මත තවත් පීඩනය යොදන ලෙස මහ බලවතුන්ගෙන් ඉල්ලා සිටි ඔහු නරුම ලෙස මෙසේ ප්‍රකාශ කලේ යඃ "මෙම සිද්ධිය කෙතරම් ම්ලේච්ඡ වුවත්, එමගින් සාම ක්‍රියාදාමය කඩාකප්පල් වීමට අපි ඉඩ නොදෙමු." තථ්‍ය කාරනය නම්, බලයට පත් වූ දා පටන් ම, රාජපක්ෂ, ජාත්‍යන්තර පිටුබලය සහතික කර ගැනීමේ සිය ආන්ඩුවේ රාජ්‍යතාන්ත්‍රික ප්‍රයත්නයේ කොටසක් ලෙස "සාමයේ මිනිසකු" ලෙස පෙනී සිටින ගමන් ම රට යුද මාවත ඔස්සේ යොමු කර තිබීම යි.

පෙබරවාරියේ ජිනීවාහි පැවති සාකච්ඡාවල දී, එල්ටීටීඊය දුර්වල කරනු පිනිස 2002 සටන් විරාම ගිවිසුම සංශෝධනය කරන ලෙස ආන්ඩුවේ නියෝජිත කන්ඩායම ඉල්ලා සිටීමෙන් පසුව, ඊනියා සාම ක්‍රියාදාමය යලි පන ගැන්වීමේ ප්‍රයත්නය බිඳ වැටීමේ අද්දරට ම පැමිනියේ ය. එම රැස්වීමෙන් ඉක්බිතිව, ආන්ඩුවේ පාලනය යටතේ පවත්නා ප්‍රදේශවල සිට එල්ටීටීඊයට එරෙහිව ක්‍රියාත්මක වන දෙමල පැරා-මිලිටරි කන්ඩායම් නිරායුධ කිරීමට ආන්ඩුව දුන් පොරොන්දුව ක්‍රියාවට දැමීමට සන්නද්ධ හමුදාවෝ අපොහොසත් වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රචන්ඩ ක්‍රියාවන්හි තාවකාලික පහල යාම ඉක්මනින් ම අවසන් වී, අප්‍රේල් මස පැවැත්වීමට නියමිතව තිබූ ජිනීවා සාකච්ඡාවල ඊලඟ වටය අතහැර දැමුනු අතර ජූනි 8-9 සාකච්ඡා සඳහා ඔස්ලෝ ගිය නියෝජිත කන්ඩායම්වලට එකිනෙකා හමු වීමට පවා නොහැකි විය.

බුෂ් ආන්ඩුව කැබතිගොල්ලෑව ප්‍රහාරය "දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයේ සකල අඩයාලම ම දරා සිටි" බව වහාම ප්‍රකාශ කොට එල්ටීටීඊය "ත්‍රස්තවාදය අතහැර දමා ශ්‍රී ලංකා ආන්ඩුව සමග ඍජු සාකච්ඡාවලට අවතීර්න විය" යුතු යැයි ඉල්ලා සිටීම අර්ථභාරී ය. වොෂිංටනය, මධ්‍යස්ථ භාවය පිලිබඳ මොන යම් හෝ මවා පෑමක් තව දුරටත් අතහැර දමා එල්ටීටීඊය ජාත්‍යන්තරව හුදකලා කිරීමට ක්‍රියා කොට ඇති අතර, එනයින් එල්ටීටීඊයට එරෙහිව වඩා ආක්‍රමනශීලී ලෙස කටයුතු කිරීමට රාජපක්ෂ ආන්ඩුව මෙන් ම ජවිපෙ හා හෙල උරුමය ද දිරිගන්වා තිබේ.

ජනාධිපති "සන්සුන් භාවයේ" හා "සාමයේ" අගය ගැන මාධ්‍යවලට බන දේශනා කරන කල, ඔහුගේ පාර්ලිමේන්තු සගයෝ යුද්ධය සඳහා කෑ මොර දෙමින් සිටිති. ඔහුගේ සුලුතර ආන්ඩුව රැඳී සිටින මුක්කු බලයන් වන ජවිපෙ හෝ හෙල උරුමය ගෙන යන ගිනි අවුලුවන ප්‍රචාරයන් සම්බන්ධයෙන් ඔවුන් විවේචනයට හෝ ඔවුන්ට චෝදනා කිරීමට රාජපක්ෂ පියවර ගෙන නැත යන්න මවිතයට කරුනක් නොවේ.

කැබතිගොල්ලෑව ප්‍රහාරයෙන් අනතුරුව, ජවිපෙ දේශපාලන කමිටුව එල්ටීටීඊයට එරෙහිව පූර්න-පරිමාන ආක්‍රමනයක් විවෘතව ඉල්ලා සිටින නිවේදනයක් නිකුත් කලේ ය. "කොටි ත්‍රස්තයන් යම් බරපතල ප්‍රහාරයක් එල්ල කල විට, ඊට ප්‍රතිචාර වසයෙන් ඉලක්ක ගත වූ කොටි කඳවුරු වෙත ගුවන් ප්‍රහාර එල්ල කිරීම පමනක් ප්‍රමානවත් නොවේ. දැන් අවශ්‍ය වන්නේ ප්‍රතිචාර දැක්වීමට පමනක් සීමා නොවුනු, මුල සිට අගට සැලසුම් කෙරුනු ක්‍රියාත්මක වැඩපිලිවෙලක් මගින් කොටි ත්‍රස්තවාදය සහමුලුන් ම පැරදවීමට පියවර ගැනීම ය."

"ව්‍යාජ (සාම) සාකච්ඡා මේස පිලිබඳව වන මෝඩ බලාපොරොත්තු අත් හැර ත්‍රස්තවාදය එය ඉල්ලා සිටින ආකාරයෙන් පරාජයට පත් කිරීමට ප්‍රමුඛත්වය" දිය යුතු යැයි එම නිවේදනය ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. උතුර හා නැගෙනහිර පරිපාලනමය වසයෙන් වෙන් කොට "පලමු වටයේ ම එම පලාත (නැගෙනහිර) කොටි ත්‍රස්තයන්ගේ බලපෑමෙන් පූර්න ලෙස නිදහස් කර ගැනීමට" මිලිටරි ආක්‍රමනයක් දියත් කරන ලෙස ද එය ඉල්ලා සිටියේ ය.

එල්ටීටීඊය ද එයට "පක්ෂව නියමින් හෝ අනියමින් සහාය දක්වන සියලු ම සංවිධාන ද" තහනම් කරන ලෙසත් ජවිපෙ ඉල්ලා සිටියේ ය. මෙම පියවරෙහි තථ්‍ය ප්‍රතිඵලය වනු ඇත්තේ, එල්ටීටීඊ-හිතැති දෙමල ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු කන්ඩායම තහනම් කිරීම මෙන් ම දෙමල සුලුතරයත් යුද්ධය යලි ඇරඹීමට විරුද්ධ වන සියලු දෙනාත් හිරිහැරයට, බිය ගැන්වීමට හා ප්‍රචන්ඩ ප්‍රහාරයන්ට ලක් කරන ව්‍යාපාරයක් උත්සන්න කරනු පිනිස පදනම සැකසීම යි.

හෙල උරුමයේ නිවේදනය ඊටත් වඩා දුෂ්ට විය. ත්‍රස්තවාදයට එරෙහිව සටන් කරනු පිනිස ජාතික එකමුතුව සඳහා කැඳවුම් කල එය "සාමය යදිමින් මෙම ත්‍රස්තවාදී කන්ඩායම" සමග මහජනතාවට හොරෙන් සාකච්ඡා නොකරන ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. හෙල උරුමය ඊලඟට අනතුරු අඟවා සිටියේ, ආන්ඩුව "රට පාවා දුන්" හොත් ජනතාව තම ආරක්ෂාව වෙනුවෙන් නීතිය අතට ගෙන ක්‍රියා කරනු ඇති බවට යි. මෙම ප්‍රකාශවල අර්ථය, සිවිල් යුද්ධය අවුලුවා ලූ 1983 ජන ඝාතනය ආකාරයේ දුෂ්ට දෙමල විරෝධී ජන ඝාතනයක් සංවිධානය කරන බවට කල යන්තමින් ආවරනිත තර්ජනයක් මිස අනෙකක් නොවේ.

ශ්‍රී ලංකාව යලිත් වරක් සිවිල් යුද්ධයේ ප්‍රපාතය අද්දරට සේන්දු වී සිටී යන්න, හුදෙක් මෙම ආන්ඩුවට පමනක් නොව සමස්ත දේශපාලන සංස්ථාපිතයට ම එරෙහි අධි-චෝදනාවකි. වැඩ කරන ජනතාවගේ අති මහත් බහුතරයේ ප්‍රජාතන්ත්‍ර අභිලාෂයන් හා සමාජ අවශ්‍යතා සපුරාලීමෙහි ලා ඓන්ද්‍රීයව අපොහොසත්ව ඇති ශ්‍රී ලංකාවේ පාලක පන්තියේ පක්ෂ, කම්කරු පන්තිය භේද කොට ස්වකීය දේශපාලනික පාලනයට මුක්කු ගසා ගනු පිනිස වර්ගෝත්තමවාදයේ හලාහල විෂෙහි සරන සොයා යාම යලි යලිත් සිදු කර ඇත. ඉහල යන බඩු මිල හා බාදනය වන ජීවන මට්ටම් අරබයා නැගෙන වර්ජන හා විරෝධතා රැල්ලකට මුහුන දී ඇති රාජපක්ෂ ආන්ඩුව රට යලිත් ව්‍යසනකාරී යුද්ධයකට ඇද දැමීමට සූදානම් වේ.

මෙම එලඹෙන ව්‍යසනය ඉල්ලා සිටින්නේ, දිවයිනේ ලේවැකි 20 අවුරුදු යුද්ධයට ප්‍රගතිශීලී විසඳුමක් සම්පාදනය කිරීමේ හැකියාව සහිත එකම සමාජ බලවේගය වන කම්කරු පන්තියේ හදිසි මැදිහත් වීමකි. සමාජවාදී සමානතා පක්ෂය (සසප) සිංහල, දෙමල හා මුස්ලිම් සියලු ම කම්කරුවන්ගෙන් ඉල්ලා සිටින්නේ, සියලු ම ආකාරයේ වර්ගවාදයන් හා ජාතිවාදයන් ප්‍රතික්ෂේප කොට, සාමය, ප්‍රජාතන්ත්‍ර අයිතීන් හා ශිෂ්ඨ ජීවන කොන්දේසි සම්බන්ධයෙන් සියලු ම වැඩ කරන ජනතාවට පවත්නා අවශ්‍යතා සපුරාලන ස්වාධීන සමාජවාදී හා ජාත්‍යන්තරවාදී ඉදිරිදර්ශනයක් මත පාදක වන ස්වාධීන ව්‍යාපාරයක් ගොඩනැගීම පිනිස සටන් වදින ලෙස යි.

උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු ශ්‍රී ලංකා හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කරන ලෙස ඉල්ලා සිටින, "ශ්‍රී ලංකාවේ යුද තර්ජනයට සමාජවාදී විසඳුමක්" යන මැයෙන් මාර්තු 11 දා නිකුත් කරන ලද සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස්ගේ ප්‍රකාශය ප්‍රවේශමෙන් අධ්‍යයනය කරන ලෙස කම්කරුවන්ගෙන්, තරුන ජනයාගෙන් හා බුද්ධිමතුන්ගෙන් අපි ඉල්ලා සිටිමු. දකුනු ආසියාවේ හා ජාත්‍යන්තරව සමාජවාදී සමූහාන්ඩු සංගමයක් සඳහා වූ වඩා පුලුල් අරගලයේ කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් ගොඩනැගීම පිනිස කම්කරු පන්තිය සටන් වැදිය යුතු ක්‍රියාමාර්ගයක් එමගින් විස්තර කෙරෙයි.

© www.wsws.org